# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2000 අංක 1 දරන ගස් හෙළීම (පාලනය කිරීමේ) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කලේ 2000 ජනවාරි මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2000 ජනවාරි මස 14 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**2000 අංක 1 දරන ගස් හෙළීම (පාලනය කිරීමේ) (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2000 ජනවාරි මස 12 වන දින.]

එල්. ඩී.—ඕ. 44/97.

**ගස් හෙළීම (පාලනය කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2000 අංක 1 දරන ගස් හෙළීම (පාලනය කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ගස් හෙළීම (පාලනය කිරීමේ) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "නියමයෙහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි" යන වචන වෙනුවට "ආහාරයට ගැනීමට සුදුසු යම් ගෙඩි, කොල හෝ ද්‍රව්‍ය උත්පාදනය කිරීමේ හැකියාව ඇති ගස් ලෙස, නියමයෙහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — 452 වන අධිකාරයේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ "ආහාර නිෂ්පාදන අධ්‍යක්ෂවරයා විසින් බලය දෙන ලද යම් තැනැත්තකු" යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :- — ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

> "කෘෂිකර්මය විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ තත් කාර්ය සඳහා ඔහු විසින් බලය දෙන ලද යම් තැනැත්තකු".

**4.** ගස් හෙළීම (පාලනය කිරීමේ) පනතේ 4 වන වගන්තිය ඉවත්කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— — 452 වන අධිකාරයේ 4 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"නියමයක් උල්ලංඝනය කිරීම සම්බන්ධ දණ්ඩනය.

4. (1) මේ පනත යටතේ කරන ලද නියමයක් හෝ එවැනි යම් නියමයක් යටතේ ප්‍රදානය කරන ලද බලපත්‍රයක ඇතුළත් කර තිබෙන යම් කොන්දේසියක් හෝ උල්ලංඝනය වන පරිදි ක්‍රියා කරන යම් තැනැත්තෙක් වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල්

පන් දහසකට නොඅඩු හා රුපියල් පණස් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයකට නොඅඩු හා අවුරුද්දක් නොඉක්මවන කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ විටක, එකී වරදට වරදකරු කරනු ලැබීමේ හේතුවෙන්, ඒ වරද කර ඇත්තේ යම් ගසක් හෝ ගසක කොටසක් සම්බන්ධයෙන් ද ඒ ගස හෝ ගසේ ඒ කොටස, රජය සතු කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ රජය සතු කරනු ලැබූ යම් ගසක් හෝ ගසක කොටසක්—

(අ) අදාළ වරදකරු කිරීමට විරුද්ධව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාවෙන් පිහිටුවන ලද මහාධිකරණය වෙත අභියාචනයක් කර නොමැති නම්, එම වරදකරු කිරීමට විරුද්ධව අභියාචනයක් කිරීම සඳහා නියමිත කාලසීමාව ඉකුත් වූ විට පරම වශයෙන් රජය සතු වන්නේ ය;

(ආ) අදාළ වරදකරු කිරීමට විරුද්ධව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණය වෙත අභියාචනයක් කර ඇත්නම්, ඒ වරදකරු කිරීම අභියාචනයේ දී අවසාන වශයෙන් ස්ථිර කරනු ලැබූ දින සිට පරම වශයෙන් රජය සතු වන්නේ ය.

මේ උපවගන්තියේ, "අදාළ වරදකරු කිරීම" යන්නෙන්, (2) වන උපවගන්තිය යටතේ යම් ගසක් හෝ ගසක කොටසක් රජය සතු කරනු ලැබුවේ යම් වරදකරු කිරීමක ප්‍රතිඵලයක් වශයෙන් ද, ඒ වරදකරු කිරීම අදහස් වේ.

(4) (3) වන උපවගන්තිය යටතේ රජය සතු කරනු ලැබූ යම් ගසක් හෝ ගසක කොටසක්, කෘෂිකර්මය විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් තත් කාර්ය සඳහා බලය දෙන ලද යම් නිලධරයකු විසින් භාරයට ගෙන, අවස්ථාවෝචිත පරිදි, ඒ ලේකම්වරයාගේ හෝ නිලධරයාගේ විධානවලට අනුකූලව ඒ ගස හෝ ගසෙහි කොටස බැහැර කළ යුතු ය.

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.